DOI: 10.31357/fhssmst.2013.00040

# මානව හිතවාදය පිළිබඳ නූතන බටහිර දාර්ශනික විමසුමක්

වී. වසන්ත

06 FEB 2013

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ පශ්චාත් උපාධි පරික්ෂණය සඳහා දර්ශන විෂය යටතේ ඉදිරිපත් කරන නිබන්ධයයි.

**පර්යේෂකගේ ප්‍රකාශය**

මේ ශාස්ත්‍රීය නිබන්ධය ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයේ මහාචාර්ය ඥානදාස පෙරේරා මහත්මාගේ සුපරීක්ෂණය යටතේ මා විසින් සම්පාදනය කරන ලද බවත්, මේ පර්යේෂණය කොටස් වශයෙන් හෝ සම්පූර්ණ වශයෙන් හෝ වෙනත් විශ්ව විද්‍යාලයකට හෝ ආයතනකට හෝ වෙනත් උපාධියක් හෝ ඩිප්ලෝමාවක් සඳහා ඉදිරිපත් නොකරන ලද බවට සහතික කරමි.

23 - 01. 2013
.................................
දිනය

.................................
අත්සන

ලි.ප.අංකය: ජී.එස්/එම්.ඒ/පී.එච්/3044/07

ටී.වසන්ත,
විහාරකන්ද,
පයාගල.

2013. 01- 20

මහාචාර්ය ඥාණදාස පෙරේරා මහතා,
ප්‍රධාන උපදේශක මගින්,
සභාපති,
මානව ශාස්ත්‍ර අධ්‍යයන මණ්ඩලය,
පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය,
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය,
ගංගොඩවිල,
නුගේගොඩ.

**සංශෝධනය කරන ලද නිබන්ධනය බාරදීම.**

වාචික පරීක්ෂණයේදී පරීක්ෂක මණ්ඩලය පෙන්වා දුන් සංශෝධන, නිවැරදි කර උපදේශකතුමාගේ නිර්දේශ සහිතව නිබන්ධනය බාර දෙමි.

උපදේශකතුමාගේ නිර්දේශය : ( නිර්දේශ කරමි ) 20/01/2013

මෙයට,
විශ්වාසී,

(ටී.වසන්ත)

## පටුන


කෘතඥතාවය

හැඳින්වීම

සාරාංශය

**I.** පරිච්ඡේදය

1 . 1 මානවහිතවාදය හැඳින්වීම 01-12

1 . 2 මානවහිතවාදය අර්ථ දැක්වීම 12-16

**II.** පරිච්ඡේදය

2 . 1 නූතන බටහිර දර්ශනයේ මානවහිතවාදි සංකල්පයේ ස්වභාවය 17-22

2 . 2 නූතන බටහිර දර්ශනයේ මානවහිතවාදි සංකල්පයේ ආරම්භය හා විකාශය 22-30

**III.** පරිච්ඡේදය

පසුබිම

3 . 1 ග්‍රීක යුගය 31-39

3 . 2 මධ්‍යතන යුගය 40-48

**IV.** පරිච්ඡේදය

නූතන බටහිර දර්ශනයේ මානවහිතාවාදි දාර්ශනික සංකල්පනා

4.1 ෆැන්සෙස්කෝ ප්ලූට්‍රාර්ක් 47

4.2 ඩෙසිඩේරියස් ඉරාස්මුස් 47-51

4.3 නිකොලෝ මැකියාවෙලී 51-52

4.4 තෝමස් මුවර් 52-54

4.5 තෝමස් හොබ්ස් 54-56

4.6 ජෝන් ලොක් 56-58

4.7 බෙනඩික් ස්පිනෝසා 59-60

4.8 ඩේවිඩ් හියුම් 60-63

4.9 ජීන් ජැක්වීක් රූසෝ 63-64

4.10 එමැනුවෙල් කාන්ට් 64-66

4.11 එඩ්මන් බර්ක් 66-68

4.12 තෝමස් පේන් 68-70

4.13 තෝමස් හිල් ග්‍රීන් 71-72

4.14 ජෙරමි බෙන්තම් 73-74

4.15 ජෝන් ස්ටුවට් මිල් 74-76

4.16 හර්බට් ස්පෙන්සර් 76-77

4.17 ඔගස්ටෙ කොම්ට් 78-79

**V.** පරිච්ඡේදය

නූතන බටහිර හා පෙරදිග දර්ශනයේ මානවහිතවාදය පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක් 80-102

සමාලෝචනය 103-112

ආශ්‍රිත ග්‍රන්ථාවලිය 113-121

# කෘතඥතාවය

මෙම ශාස්ත්‍රපති උපාධි නිබන්ධය සැකසීමේදී උපදේශකත්වය ලබාදුන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ දර්ශනය හා මනෝවිද්‍යාව පිළිබඳ මහාචාර්ය ඥානදාස පෙරේරා හා කැළණිය විශ්වවිද්‍යාලයේ දර්ශනය පිළිබඳ මහාචාර්ය දයා එදිරිසිංහ ගුරු භවතුන්ට පළමුව මගේ ගෞරවණීය කෘතඥතාවය පුද කරමි.

මෙම නිබන්ධය සඳහා අවශ්‍යය තොරතුරු ලබා ගැනීම සඳහා පොත්පත් ලබා ගැනීම සඳහා දායකත්වය ලබා දුන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාල පුස්තකාලය, ජාතික පුස්තකාලය හා කොළඹ මහජන පුස්තකාලය වෙත, මාගේ කෘතඥතාවය පුද කරමි. තොරතුරු ලබා ගැනීමට සහාය දැක්වූ ලසන්තා කරුණාරත්න මෙනවිය වෙත හා මෙම නිබන්ධයේ සියලු වැඩ කටයුතු වෙනුවෙන් නන් අයුරින් සහාය දැක්වූ සියලු දෙනාටම මගේ කෘතඥතාවය පුද කරමි.

## හැඳින්වීම

### අරමුණ

මානවයාගේ පැවැත්ම යහපත හා නිදහසට මුල් තැන දෙන භෞතික ලෝකයේ පැවැත්මත්, මානව පැවැත්මත්, වෙන් කරන මුල් පදනම වන්නේ මානවයාගේ වරණිය නිදහස හා ස්වාධීනත්වයයි. වර්තමාන ලෝකය තුළ මානවයා විවිධාකාරයේ දේශපාලනික අධිකාරිවාදි, ආගමික හා සංස්කෘතික අධිපතිවාදි බැමිවලින් කොටු කර තබා ගැනිමට උත්සුක වී ඇත. එබැවින් මෙය මානවයාගේ නිදහසට එල්ල වී ඇති බරපතල අභියෝගයකි. නුතන මානවයාගේ තම පැවැත්ම ගෙන යන්නේ යුදවාදී, වර්ගවාදි, ජාතිවාදි, වර්ණභේදවාදි ත්‍රස්තවාදි,කුලවාදී, ගෝත්‍රවාදි හා ආගම්වාදි වටපිටාවකය.. යහපත් හා සාමකාමි ලෝකයක් තුළ ජිවත් වීමට මානවයාට ඇති අයිතිය යටපත් කරමින් ලෝක තුළ ජිවත්වන බොහෝමයක් මානවයින් ක්‍රියා කරන්නේ තම අධිපතිවාදි බලය හෝ ශක්තිය යොදා ගෙන අන් මානවයින් යටපත් කරගැනීමටය. මානවයා සත්වයෙකු ලෙස ලෝකය තුළ පරිනාමය වූ දිනයේ සිටි වර්ධනය කරගත් ඥානමය හැකියාවන් පදනම් කරගෙන අන් සතුන්ගෙන් පැහැදිලිව වෙනස්විය. මෙය මානව ඉතිහාසය තුළ දී මානවයා ලැබූ විශිෂ්ඨ ජයග්‍රහණයක් ලෙස හැඳින්විය හැකිය. මානවයා සතු අනර්ඝ හැකියාවන් හා දක්ෂතාවයන් හේතු කොටගෙන මානවයාගේ පැවැත්ම ඉතාමත් ශක්තිමත් ආකාරයට ලෝකය තුළ ස්ථාපිත වී ඇත. මානවහිතවාදය හුදෙක්ම මානවයා අරමුණු කරගත් දාර්ශනික ප්‍රවේශයක් ලෙස හැඳින්විය හැකිය. දාර්ශනික ඉතිහාසය තුළ නුතන බටහිර දාර්ශනික යුගයේ බිහි වූ විවිධ දර්ශනික සංකල්පනාවන් රාශියක් මානවහිතවාදය සම්බන්ධයෙන් ඉදිරිපත් කොට ඇත. මානව නිදහස, මානව සතුට/ප්‍රිතිය, මානවයාගේ ස්වධීනත්වය, මානවයාගේ ස්වච්ජන්දතාවය, මානවයාගේ පැවැත්ම, මානව සංස්කෘතිය, මානව කලාව හා මානව ශ්‍රමය යන සංකල්පනා රාශියක් සම්බන්ධයෙන් දාර්ශනික සංකල්ප ඉදිරිපත් කොට ඇත. මෙම නිබන්ධයේ ප්‍රධාන අරමුණ වන්නේ නුතන බටහිර දාර්ශනික යුගය තුළදී මානවයා කේන්ද්‍රකරගත් දාර්ශනික සංකල්ප හදුනාගෙන, එම දාර්ශනික සංකල්පනාවන් විමසුමට ලක් කොට ඉදිරිපත් කිරිම, මෙම නිබන්ධයේ අරමුණ ලෙස හදුනා ගත හැකිය.

## විෂය සීමාව

නූතන බටහිර දාර්ශනික යුගයේ මානවහිතවාදය පිළිබඳ දාර්ශනික විග්‍රහයක යෙදීම මෙම නිබන්ධයේ ප්‍රධාන විෂය පථය ලෙස හැඳින්විය හැකිය. නූතන බටහිර දාර්ශනික යුගයේදී මානවහිතවාදය සම්බන්ධයෙන් විවිධ දාර්ශනිකයින් විසින් ඉදිරිපත් කරන ලද දාර්ශනික සංකල්පනාවන් මෙම නිබන්ධය මගින් විග්‍රහකොට ඉදිරිපත් කිරිමට බලාපොරොත්තු වෙමි. මෙම නිබන්ධය ප්‍රධාන වශයෙන්ම දර්ශන විෂය පදනම් කරගෙන ඉදිරිපත් කෙරේ, තවද මානවහිතවාදී දාර්ශනික සංකල්පය සම්බන්ධයෙන් අදහස් ඉදිරිපත් කොට ඇති මානව විද්‍යාව , දේශපාලන විද්‍යාව, සමාජ විද්‍යාව හා ඉතිහාසය ආදි වූ අනෙකුත් විෂයන්ගේ සහයෝගයද ලබා ගැනිමට අපෙක්ෂා කරමි. විශේෂයෙන්ම නූතන දාර්ශනික යුගය ආශ්‍රිතව කරුණු ඉදිරිපත් කිරිම මේ නිබන්ධයේ විෂය සීමාව ලෙස සැලකිය හැකිය.

## පර්යේෂණ විධික්‍රමය

මෙම පර්යේෂණ නිබන්ධනය අධ්‍යයනය කිරිම සඳහා ප්‍රත්‍යයක අධ්‍යයන ක්‍රමය හෙවත් සිද්ධී අධ්‍යයන ක්‍රමය යොදා ගැනීමට බලාපොරොත්තු වෙමි. ප්‍රත්‍යයක අධ්‍යයන ක්‍රමය භාවිතා කිරිම තුළින් ඉතාමත් පුළුල් ලෙස නූතන බටහිර දාර්ශනික සංකල්ප එක් සිද්ධියක් ලෙස සලකා ක්‍රමවත් ලෙසත්, ගැඹුරින් හා සියුම් ලෙසත්, මෙම නිබන්ධනය විමර්ශනය කිරිමට හැකියාව ලැබේ. ඊට අමතරව අවශ්‍ය තොරතුරු රැස්කිරිමට හා ඒවා විශ්ලේෂණය කර නිගමනවලට එළඹීම සඳහා අවශ්‍ය බහුවිධ පැති හා ක්ෂේත්‍ර තුළින් විග්‍රහකර, අවශ්‍ය පදනම සකස් කර ගැනිමට මෙම අධ්‍යයන ක්‍රමය වඩාත් සාර්ථක වේ යැයි අපේක්ෂා කරමි.

මෙම පර්යේෂණ විධික්‍රමය යොදා ගෙන නිබන්ධනය සකස් කිරිමට අවශ්‍ය සාහිත්‍යමය තොරතුර ලබාගැනිම සඳහා පහත සඳහන් මුලාශ්‍ර භාවිතා කිරිමට අදහස් කරමි.

1 සම්භාව්‍යය මුලාශ්‍ර

2 ද්විතික මුලාශ්‍ර

අන්තර්ජාලය භාවිතයෙන් ලබා ගන්නා තොරතුරු මෙම නිබන්ධයට ඇතුළත් කිරීමට අපෙක්ෂා කරමි. එමෙන්ම මානවහිතවාදය සම්බන්ධයෙන් වෙනත් විෂයන් මගින් ඉදිරිපත් කොට ඇති විවිධ සංකල්ප භාවිතා කිරීමටද අපේක්ෂා කරමි.

සමාජ අදාළත්වය

නූතන බටහිර දර්ශනයේ මානවහිතවාදී දාර්ශනික සංකල්පනාවන් වර්තමාන මානව සමාජයට අදාල වන්නේද? යන්න විමසා බැලිය යුතු වැදගත් කරුණක් ලෙස සැලකිය හැකිය. මානවහිතවාදී දාර්ශනය මගින් අර්ථවත් වන්නේ ලෝකයේ ජීවත්වන සියලුම මානවයින්ට හිමි ගරුත්වය, පැවැත්ම, අභිවෘද්ධිය, ප්‍රගතිය, නිදහස, යුතුකම් හා වගකීම්, ස්වාධීනත්වය හා සුභසාධනය පිළිබඳව අවධානය යොමු කිරීමත්, මුළුමහත් මානව සමාජය බෙදීමට මුල්වූ ප්‍රධාන සාධක ලෙස ජාතිවාදය, කුලවාදය, වර්ණභේදය, ආගම්වාදය හා පන්තිභේදය වැනි පටු සංකල්ප වර්තමාන මානව සමාජය වෙලාගෙන ඇත. ඒවාගේම සමස්ථ මානව ප්‍රජාව හමුවේ ඇති බරපතල ඛේදවාචකයක් ලෙස යුදවාදය හා ත්‍රස්තවාදය හැදින්විය හැකිය. මානවහිතවාදී දාර්ශනික සංකල්ප මගින් මෙම ගැටළු පිළිබඳව ගැඹුරින් විමසීමක් කිරීමට හැකිය.

පරමාර්ථය

නූතන බටහිර දර්ශනයේ මානවහිතවාදී දාර්ශනික සංකල්පය පිළිබඳව මෙම නිබන්ධනය මගින් විමසීමක් කිරීමට මා අදහස් කළේ වර්තනමාන මානවයා හමුවේ ඇති විවිධ අභියෝග, ගැටළු හා දුස්කරතා හදුනාගෙන, ඒවා මානව සමාජයෙන් ඉවත් කර හෝ අවම කරගෙන මානවයාට යහපත් ලෙස හා ගෞරවයෙන් යුක්තව ජීවත්වීමට අවශ්‍ය සාමකාමී මානව සමාජයක් ලෝකය තුළ ගොඩනගා ගැනීම සඳහා මානවහිතවාදී දාර්ශනික සංකල්පනා වර්තමාන මානවයා වෙත හදුන්වාදීමයි.

# පලමු පරිච්ඡේදය

## 1.1 මානවහිතවාදය හැඳින්වීම

පෙර - අපරදිග දාර්ශනික සංකල්ප පිළිබඳව සලකා බැලීමේදී මානවයා කේන්ද්‍ර කරගත් දාර්ශනික සංකල්ප රාශියක් ගොඩනැගී තිබීම වැදගත් කොට සැලකිය හැකිය. මෙලෙස ගොඩ නැගුණු දාර්ශනික සංකල්ප මානවහිතවාදී දාර්ශනික සංකල්ප ලෙස හඳුනාගත හැකිය. ලෝකයේ ගොඩ නැගුණු විවිධ දාර්ශනික යුග ඔස්සේ මානව ක්‍රියාකාරිත්වය පදනම් කොට ගෙන මානවහිතවාදී දාර්ශනිකයින් විසින් මානවයා සම්බන්ධයෙන් ඉදිරිපත් කළ සංකල්ප වල එකතුවක් ලෙසද, මානවහිතවාදී දාර්ශනික සංකල්පය හැඳින්විය හැකිය.

ආදි යුගවල ජීවත්වූ මානවයින් හා නූතන මානවයින් අතර පැහැදිලි වෙනස්කම් රාශියක් මානවයින් පිළිබඳ අධ්‍යයනය කළ පර්යේෂකයින් විසින් හෙළකර ගෙන ඇත. ආදි යුගයේ ජීවත්වූ මානවයාගේ මූලික හැසිරීම් රටාව හා ජීවන ස්වභාවය නූතන යුගයේ මානවයාගේ හැසිරීම් රටාව හා ජීවන ස්වභාව අතර පැහැදිලි වෙනස්කම් රාශියක් හඳුනාගත හැකිය. නූතන මානවයා වර්ෂ දහස් ගණනක අත්දැකීම් සම්භාරයක එකතුවක් ලෙසද හැඳින්විය හැකිය. ඈත යුගලවල ජීවත්වූ මානවයා තම පැවැත්ම තහවුරු කර ගැනීම සඳහා විවිධ පියවර රාශියක් ගෙන ඇත. සතුන් දඩයම් කරමින් මස් මාංශ අනුභව කරමින්, ගල්ගුහා ආශ්‍රිතව හෝ ගසක බෙනයක් තුළ අව්ව වැස්ස නොබලා විවිධ රෝගාබාධ මානසික හා කායික අපහසුතා විඳදරා ගනිමින්, මානවයා පියනැගූ ගමන් මග ඉතා කටුකවිය. මානවයා තම පැවැත්ම පිළිබඳ සුවිශාල අභියෝග රාශියක් එදිරියේ අතිවිශාල ජයග්‍රහණ රාශියක් අත්කර ගැනීමට සමත්වූ විශ්වයේ ජීවත් වන එකම සත්වයා ලෙස හැඳින්විය හැකිය. මානවයාගේ ව්‍යාප්තිය දෙස බලන විට, පෘථිවියේ එක් ස්ථානයකින් ආරම්භවී විවිධ ප්‍රදේශ කරා මානවයාගේ ව්‍යාප්තිය හා වර්ධනය සිදුවූ බව දැනට කරන ලද පර්යේෂණ මගින් සොයා ගෙන ඇත.

ලෝකයේ විවිධ ප්‍රදේශ කරා ව්‍යාප්තවූ මානවයාගේ බාහිර ස්වරූපය ආශ්‍රිතව වෙනස්කම් රාශියක් ඇත. මෙම වෙනස්කම් කෙරෙහි ප්‍රබල ලෙස බලපා ඇත්තේ ලෝකයේ පවතින පාරිසරික, දේශගුණික හා කාලගුණ විවිධත්වයි,

මානවයාගේ  බාහිර ස්වරූපය පිළිබඳ වෙනස්කම්ය. කෙසේවුවත් මානවයාගේ මූලික අවශ්‍යතා හා ඔහුගේ චර්යාවන් හා මානසික අවශ්‍යතා තුළ පැහැදිලි වෙනස්කම් හඳුනාගත නොහැකිය. ලෝකයේ කුමන රටක හෝ ප්‍රදේශයක ජීවත්වුවත්, මානවයා තුළ අසමානතාවයක් දක්නට නොලැබෙන බව පැහැදිලිව හඳුනාගත හැකිය.

මානවහිතවාදී දාර්ශනික සංකල්පයේ ඉතා වැදගත් සංකල්පයක් ලෙස මානවයාගේ පැවැත්ම හඳුනාගත හැකිය. මානවයාගේ පැවැත්ම  හා නිදහසට මුල් තැන දෙන භෞතික ලෝකයේ පැවැත්මත්, මානව පැවැත්මත්, වෙන් කරන මුල් පදනම වන්නේ මානවයාගේ වරණීය නිදහස හා ස්වාධීනත්වයයි. ලෝකය තුළ මානවයා විවිධාකාර දේශපාලන අධිකාරිවාදී, ආගමික හෝ සංස්කෘතික අධිපතිවාදී බැම්වලින් කොටු කර තබා ගැනීමට උත්සහ ගෙන ඇති බැවින්, මෙය මානවයාගේ නිදහසට හා පැවැත්මට එල්ලවී ඇති බරපතල අභියෝගයක් ලෙස හැඳින්විය හැකිය.

නූතන මානවයාගේ පැවැත්ම විශාල අභියෝග රාශියක් ඉදිරියේ ගෙනයෑමට සිදුවී ඇත. යුදවාදී, ජාතිවාදී,වර්ණභේදවාදී,කුලවාදී, ත්‍රස්තවාදී හා පන්තිභේදවාදී පරිසරයක් තුළ මානවයා බෙදා වෙන්කර තැබීම නිසා මානවයින් අතර නිතරන්තරයෙන්ම ගැටුම් නිර්මාණයවී ඇත. මේ තත්ත්වය මානවයාගේ පැවැත්මටට ඉතා බරපතල තත්ත්වයක් ලෙස හැඳින්විය හැකිය.මෙම කරුණුවලට අමතරව මානවයා නිරන්තරයෙන් මුහුණ දෙන ස්වභාවික ව්‍යවසනයන් මානවයාගේ ජීවත්වීම කෙරෙහි තදින් බලපා ඇත. ගිනිකඳු පිපිරීම, සුනාමි, ජලගැලීම්, සුළිසුළං භූමිකම්පා ආදිය මානවයාගේ වර්ධනය කෙරෙහි තදින් බලපා ඇති අයහපත්  ස්වභාවික සාධක ලෙස හඳුනාගත හැකිය. මානවයා විසින් ලෝකය තුළ සොයාගත් හා නිර්මාණය කළ තාක්ෂණික හා විද්‍යාත්මක නිෂ්පාදන මානවයාගේ පැවැත්ම කෙරෙහි ඍජු ලෙස බලපෑමක් ඇති කර ඇත. මෙම තත්ත්වය මානවහිතවාදී දාර්ශනික සංල්පනාවලට විශාල අභියෝගයක් ලෙස හැදිනවිය හැකිය.

මානව පරිණාමය දෙස බලන විට අන් සත්වයින්ට වඩා ඉතාමත් වේගයෙන් බුද්ධිමය හැකියාවන් හා විවිධ ක්‍රියාකාරකම් මානවයා වර්ධනය කර ගෙන ඇත. මේ ආකාරයට ලබාගත් මානව ජයග්‍රහණ මානව ඉතිහාසය පුරාම සටහන් වී ඇත.

ප්‍රාථමික යුගයේ ජීවත් වූ මානවයාගේ මූලික අවශ්‍යතා ඉතා සීමිත වූ අතර, තම ජීවිතය පවත්වා ගැනීම සඳහා පමණක්, තම අවධානය යොමු කොට ඇති බව පැරණි මානවයා පිළිබඳ අධ්‍යයනය කර ඇති පුරා විද්‍යාඥයින් ගේ අදහස වෙයි. වර්තමානයේ ජීවත් වන මානවයාත්, මීට වසර හතලිස් දහසක්ට පමණ පෙර ජීවත් වූ මානවයින් අතර කැපීපෙන පැහැදිලි වෙනස්කම් රාශියක් ඇති බව පුරාණ මානවයින් පිළිබඳ අධ්‍යයනය කර ඇති මානව විද්‍යාඥයිනගේ මතයයි. මානවයා ලෝකය තුළ අන් සතුන් ගෙන් පැහැදිලි ලෙස, වෙන් වන්නේ මානව දැනුම පදනම් කරගත්, මානව ක්‍රියාකාරම් හේතු කොට ගෙන, මානවයා ලැබූ විශිෂ්ඨ වර්ධනය හා ප්‍රගතිය අනුවයි.

ප්‍රාථමික මානවයා ජීවත් වූයේ ස්වභාධර්මයා කෙරෙහි අසීමිතවූ බියකින්ය, ඒ නිසාම ඒ යුගයේ මානවයා ස්වභාවධර්මයා දේවත්වයෙන් සැලකිමට උත්සුකවූ අතර දෙවියන් වෙනුවෙන් පුදපූජාද පැවැත්විය. පසුකාලීන යුගයේ ජීවත්වූ මානවයා තමා විසින්ම නිර්මාණය කර ගත් දෙවිකෙනෙකු කෙරේ විශ්වාසය තබා ක්‍රියා කොට ඇත. පෙරඅපර දිග ජීවත්වූ සියලුම පැරණි මානවයින් දේව සංකල්පය කෙරෙහි වඩ වඩාත් නැඹුරු විය.ආදි මානවයාගේ දේව සංකල්පය බහු දේවවාදයක් වූ අතර පසු කාලයේදී, මෙය ඒක දේවවාදයක් බවට පත්විය. මේ බව පෙර-අපරදිග මානවයින් ගේ දේව සංකල්පය පිළිබඳ අධ්‍යයනය කරන විට පෙනි යන කරුණක් ලෙස සැලකිය හැකිය. "රාජ්‍ය පාලකයාද දේව නියෝජිතයා ලෙස කටයුතු කොට ඇත. ඊජිප්තු රජු දෙවියා ලෙස හෝ දේව පුත්‍රයා ලෙසද සැලකුණි. ඒ සමගම ඔහු ප්‍රධාන පූජකයාද විය."[1] පසුකාලින යුගවලදී මානවයාගේ දේව වන්දනාව පූජකයික් විසින් තම ආධිපත්‍යයට ගැනීමත්, සමගම මානවයා යටපත් කරගෙන දෙවියන් ඉදිරියෙන් පෙනි සිටි බව පෙන්වාදිය හැකිය. ඒ අනුව පූජකයින් පෙන්වා දුන්නේ සියල්ල සිදුකරනනේ දෙවියන් විසින් බවය. දෙවියන් ඉදිරියේ මානවයා සුවච කිකරු තැනැත්තෙකු බවට පත්විම, පූජක ආධිපත්‍යය හා දේව සංකල්පය තදින් ස්ථාපිතවිම, නිසා මානවයා දැඩි ලෙස පාලනය කිරිමටත්, මානව නිදහස, ස්වච්ජන්දතාවය හා මානව අයිතිය යටපත් කිරිමට, පූජකයින්ට අවස්ථාව උදාවූ බව පෙන්වාදිය හැකිය. මෙම තත්ත්වය පෙර - අපරදිග සියලුම මානවයින්ට අත්වූ පොදු ඛේදවාචකයක් විය.

ආදි ග්‍රීක දර්ශනික යුගයේදි මානවයා පිළිබඳ ඉතා වැදගත් දාර්ශනික සංකල්ප රාශියක් ඉදිරිපත් වි ඇත. ග්‍රීක දර්ශනයේ අන්තර්ගත මානවහිතවාදි දාර්ශනික සංකල්ප තුළින් මානවයා සදාචාර හා බුද්ධිමය මාර්ගයක් වෙත යොමු කරණු ලැබිය. ග්‍රීකය මුල් කර ගෙන ආරම්භවු මානවහිතවාදි දාර්ශනික සංකපල්ප මගින් මානවයාගේ නිදහස, ගරුත්වය, පැවැත්ම හා ස්වාධිනත්වය වඩාත් ශක්තිමත් විය. කෙසේ නමුත් "මුල් යුගයේදි ග්‍රීක දර්ශනය විශ්වය පිළිබඳව අවධානය යොමු කළත්, පශ්චාත් යුගයේදි ග්‍රීක දර්ශනය මනුෂ්‍යයා පිළිබඳ දර්ශනයක්"[2] බවට පත්විය. නූතන බටහිර දර්ශනය ආරම්භ විමට පෙර එනම් මධ්‍යතන යුගයේදී පූජක පන්තිය බටහිර යුරෝපය පුරාම තම ආධිපත්‍යය ගොඩනගා ඇති බවට බටහිර දර්ශනික ඉතිසාය දෙස බලන විට පෙනි යන ප්‍රධාන සාධකයක් ලෙස හැදින්විය හැකිය. යුරෝපයේ මධ්‍යකාලින යුගයේ අවසන් භාගයේදි යුරෝපය පුරාම වර්ධනයවූ පුනරුදය මගින් යුරෝපයේ මතුවු නව අදහස් රාශියක් වර්ධනය විය. ග්‍රීක හා රෝම යුගයේ සාහිත්‍යය හා කලා අදහස්වලට නව ජීවනයක් ලබා දිමට එවක සිට චින්තකයින් දැඩි වෙහෙසක් ගැනිම නිසා මධ්‍යකාලින යුගයයේ පැවැති අඳුරු ස්වභාවය කෙරෙහි පැවැති විරෝධය ඉස්මතුවිමක් දක්නට ලැබුණි.

කතෝලික පල්ලියේ දැඩි ආගමික තහංචිවලින් වෙළි සිටි මිනිසුන් තමාගේ නිදහස සොයා ඇත යුගයේ පැවැති නිදහස් අදහස් කෙරෙහි නැඹුරුවීම, මානවහිතවාදි දාර්ශනික සංකල්ප ඇති වීම හා ඒවා ශක්තිමත් වීම, පුනරුදයත් සමඟ සිදුවිම හේතු කොට ගෙන, ස්වභාවධර්මයේ සුන්දරත්වය හා මානවයාගේ උසස් තත්ත්වය වඩාත් උද්දීපනය විය. පුනරුදයත් සමඟම මානවයා කේන්ද්‍රකරගත් චින්තනය වර්ධනය විමත්, සමඟ මධ්‍යකාලින යුගයේ පැවැති පූජක ආධිපත්‍ය ක්‍රමයෙන් හින විය. එහි ප්‍රථිපලය වූයේ ඉතාලිය මුල්කරගෙන ආරම්භවූ ග්‍රීක හා රෝම යුගයේ පැවැති විවිධවූ ලෞකික විෂයන් කෙරෙහි අවධානය යොමු විමයි. පැරණි ග්‍රීක හා රෝම දාර්ශනික පද්ධති අධ්‍යයනය කිරිම, ලතින් හා ග්‍රීක භාෂාව ඉගෙනිමත්, විවිධ කලාශිල්ප හා සාහිත්‍යය කෙරෙහි නැඹුරුවිම හා ක්‍රිස්තුස්තියානි ධර්මයේ මූලික අදහස් සම්භාවනිය යුගයේ අදහස් සමග එකතුවි මානවහිතවාදි සංකල්පනා රාශියක් මෙ යුගයේ දී බිහිවිම වැදගත් කොට සැලකිය හැකිය.

මධ්‍යකාලීන කතෝලික පල්ලියේ මූලික අදහසවූයේ මානවයා උපදින විටම පව් සමග ඉපදී ඇති බැවින්, ඔවුන් සියලු දෙනාම පව් සමාකර ගතයුතු බව පූජකයින් පෙන්වා දෙනු ලැබිය. කෙසේ නමුත් මධ්‍යකාලීන යුගයෙන් පසු බිහිවූ විවිධ චින්තකයින්ගේ අවධානය යොමුවූයේ මානවයා හා ලෝකය පිළිබඳ නව සංල්පනා බිහිකිරීමටය. මෙහි ප්‍රතිඵලය ලෙස පුනරුදය හැඳින්විය හැකිය. පුනරුදය මගින් බිහිකළ මානවහිතවාදී දාර්ශනිකයන් පෙන්වා දුන්නේ මානවයා උපතින් පව් කාරයකු නොවන බවත්, ඔහුට සදාචාරාත්මක වටිනාකම්, සත්‍ය හා ප්‍රඥාව ලබා ගැනීමට හැකියාව ඇති බවය. ඒ වාගේම පූජකයින් නොමැතිව මානවයාට සදාචාරාත්මක වටිනාකම් ඉගෙන ගැනීමට හැකියාව ඇති බව මානවහිතවාදී දාර්ශනිකයින් පෙන්වා දුන්නේය.

නූතන දාර්ශනික යුගය ආරම්භවීමත් සමඟම මානවහිතවාදී දේශපාලන දාර්ශනික සංකල්පනා රාශියක් රචනා විය. රාජ්‍ය පාලනය පිළිබඳ මැකියාවෙලිගේ දේශපාලන න්‍යාය මගින් සම්ප්‍රදායික භක්තිය පදනම් කරගත් පාලන තන්ත්‍රයට විරුද්ධ කුමාරයා කෘතිය බිහිවිය. කතෝලික පල්ලියේ දැඩි මතවාදයට විරුද්ධ වෙමින් ඉරුස්මුස් නම් චින්තකයා මානවහිතවාදී සංකල්පනා ඉදිරිපත් කළේය. නූතන රාජ්‍යය සම්බන්ධයෙන් නවතම දාර්ශනික සංකල්පයක් වන මිනිසාගේ පරමාධිපත්‍ය පිළිබඳ නව දාර්ශනික සංකල්පයක් ඉදිරිපත් කළේ 16 වන සියවසේ බෝදැන් විසිනි.* එමෙන්ම නිදහස පිළිබඳ නව සංකල්ප රාශියක් මේ යුගයේදී බිහිවිය.

මානවයාගේ සතුට හා පහසුව සඳහා මානව දැනුම පදනම් කර ගෙන විද්‍යාත්මක සොයාගැනීම් රාශියක් මේ යුගයේ බිහිවිය. තමා ජීවත්වන වටපිටාව ගැන සැලකිලිමත්වූ මිනිසා දැනුම රැස්කර ගැනීමට වෙහෙසුනි. "මිනිසා විසින් ගොඩනගන ලද එම දැනුම පසු කාලයේදී විද්‍යාව ලෙස හැඳින්විය."[3] එම නව විද්‍යා සංකල්ප මගින් නව විද්‍යාත්මක නිර්මාණ රාශියක් නිපදවා ගැනීමට මානවයා සමත්විය. විශේෂයෙන්ම ගැලිලියෝ ගැලිලි, අයිසැක් නිව්ටන් හා කොපර්නිකස් වැනි විද්‍යාඥයින්ගේ සොයාගැනීම් නිසා මානවහිතවාදී විද්‍යා දාර්ශනය වඩාත් ශක්තිමත් විය. මධ්‍යතන යුගයේ පැවැති ආධානග්‍රාහී චින්තනය ඉතා වේගයෙන් බොඳවීමට

* Six books on the state
Republic

ලක්විය. පල්ලියේ ආධිපත්‍යය ඉතා වේගයෙන් පිරිහිමකට ලක් වූ අතර චින්තනමය විප්ලවයක් නූතන බටහිර දර්ශනය තුළ ස්ථාපිත විය. නූතන බටහිර දර්ශනය මගින් මානවහිතිවාදි දාර්ශිනික සංකල්පනා වර්ධනය වීම සඳහා විශාල බලපෑමක් සිදුවිය. ක්‍රිස්තියානි පල්ලිය පිළිගත් විශ්වාසය හා භක්තිය මුල්කරගත් ආගමික සංකල්ප මගින් දෙවියන් වහන්සේ නියත හා ලෝකෝත්තර බව අවධාරණය කරණු ලැබිය. නූතන බටහිර දර්ශනය මගින් මෙම දේව සංකල්පය මානව අනුභූතියෙන් පිටස්තර එකක් ලෙස සලකනු ලැබිම, නිසා මානවයා අනියත හා ලෞකික වස්තුවක් ලෙස නූතන දර්ශනය අර්ථවත් කරණු ලැබිය. ඒ අනුව නියත වු දෙවියන් වහන්සේව අනියත මානවයාට දැක ගත නොහැකි බව පෙන්වාදි ඇත. එබැවින් නියත දෙවියන් පිළිබඳව අනියත මානවයා විසින් ප්‍රකාශ කරන සෑම අදහසක්ම හිස් හා බොල් අදහස් ලෙස නූතන බටහිර දර්ශනය පිළිගෙන ඇත. මෙම නූතන බටහිර දර්ශනයේ සැබෑ මානවහිතවාදි සංකල්පයක් ලෙස හැඳින්විය හැකිය.

ලෝකය ජීවත්වන සියලුම මානවයින්ට බලපාන පොදු ගැටළු රාශියක් නූතන ලෝකය තුළ ගොඩනැගි ඇත. මානවයාගේ පැවැත්ම ශක්තිමත්ව හා යහපත් ලෙස ගෙන යෑම සඳහා සුදුසු පරිසරයක් ලෝකය තුළ බිහි නොවිම මානව ප්‍රජාව මුහුණදි ඇති බරපතල ගැටළුවක් ලෙස හඳුනාගත හැකිය. නූතන යුගයේ ජීවත්වන මානවයා මුහුණදි ඇති මෙම ගැටළු හේතුකොට ගෙන මානවයාගේ පැවැත්මට හා වර්ධනයට බලපෑම් කර ඇත. මානවයාගේ ගරුත්වය හා උදාරබව සම්බන්ධයෙන් සකලන විට කැපීපෙන ලක්‍ෂණයක් වන්නේ ලෝකය තුළ ජීවත් වන මානව ප්‍රජාව යටපත් කොටගත් විද්‍යාත්මක හා කාර්මික දැනුම විසින් මානවයා සතු සුවිශේෂි කුසලතාවයන් යටපත් කොට ඒ වෙනුවට තාක්‍ෂණික හා කාර්මික ආධිපත්‍යයට මානවයා යටපත් විම, නිසා නූතන මානවයා දැඩි අපහසුතාවයට ලක් වි ඇත. ඒවාගේම, මානවයාගේ ස්වභාවික ඥානමය හැකියාවන් කෙරෙහි අඩුසැලකිල්ලක් දැක්වීම නිසා නූතන මානවයාගේ ඥානමය හැකියාවන් මානවයාගේ වර්ධනයට හා ප්‍රගතියට යොදා නොගැනිම, හේතු කොට ගෙන මානව ගරුත්වය හා උදාර බව අභියෝගයකට ලක්විම නොසලකා හැරිය නොහැකිය.

මානවයාගේ පැවැත්මට හා වර්ධනයට නුතන ලෝකය තුළ විශාල අභියෝග රාශියක් එල්ලවී ඇත. මානවයා ලබාගත් නුතන විද්‍යාත්මක දැනුම කිසිදු වග විභාගයකින් තොරව භාවිතා කිරිම නිසා සමස්ථ මානව ප්‍රජාව විනාශය කරා යොමුවී ඇති බව සටහන් කළ යුතුය. ඉතාමත් වේගවත්ව විශාල මානවයින් සංඛ්‍යාවක් ඝාතනය කිරිමට හැකි ආකාරයේ විවිධ යුද උපකරණ රාශියක් නුතන ලෝකය තුළ නිර්මාණය වි ඇත. රසායනික ද්‍රව්‍ය භාවිතා කරමින් නිපදවා ඇති විවිධ රසායනික භාවිතයන් නිසා මානව සමාජය ස්වභාවික අපාදාවලට අමතරව මෙම රසායනික භාවිතායන් යොදා ගැනිම නිසා මානව පැවැත්ම, ගැටලු රාශියකට මුහුණදි ඇත. මානවයා ජීවත්වන පරිසරය මානවයාගේ පැවැත්ම සඳහා සුදුසු පසුබිමක් සකස් කර නොමැති කම නිසා නුතන මානව සමාජය විශාල පාරිසරික අවධානමකට මුහුණ පා ඇත. පෘථිවියේ උෂ්ණත්වය ඉහළ යෑම, අධික වර්ෂාව, හිමකඳු දියවීම හා නාය යෑම වැනි ගැටලු රාශියක් නුතන මානව ප්‍රජාව මුහුණ දෙන බරපතල ස්වභාවික ව්‍යවසන ලෙස හදුනාගත හැකිය. මෙම තත්ත්වය මානවයාගේ යහපැත්මට, ප්‍රගතියට හා වර්ධනයට බලපා ඇත. මේ තත්ත්වය හේතු කොටගෙන, පෘථිවියෙන් මානවයා වඳවි යෑ මේ තත්ත්වයක් උදාවිමට තිබෙන ඉඩකඩ වැඩිය. මානවයාගේ පැවැත්මට හා වර්ධනයට බලපාන ප්‍රබල ගැටලුවක් ලෙස හැදුනාගත හැකි සාධයකි, විවිධ මරාන්තික රෝග, ඉතා ඉක්මනින් මෙම රෝග මානවයාවෙත ලගා විම නිසා නුතන මානවයාගේ පැවැත්මට හා ප්‍රගතියට දැඩි බලපෑමක් එල්ල වි ඇත.

සංස්කෘති වශයෙන් මානවයා මුහුණ පා ඇති අභියෝග රාශියකි, විවිධ ආගමික නිකායන් විසින් මානව ප්‍රජාව බෙදා වෙන්කොට ඇත. ඒ ඒ ආගම් විසින් ගොඩනගා ඇති විවිධ මතිමතාන්තර මගින් මානවයා වෙන් කොට, මානවයින් අතර විශාල යුද හා ආරවුල් නිර්මාණය කොට ඇත. ඒවාගේම මානවයා කුලය, පන්තිය , වර්ණය හා ජාතිය මුල්කරගෙන ලෝකයේ ජිවත්වන මානව ප්‍රජාව අතර ඉතාමත් බරපත බෙදිම් නිර්මාණය කොට ඇත. ලෝකයේ ජිවත්වන සියලුම මානවයින් තම අදහස් එකිනෙකා අතර සංනිවේදනය කර ගැනිම සඳහා කුමන හෝ භාෂාවක් භාවිතා කරණ අතර භාෂාව මත මානවයා වෙන්කර තැබිම සඳහා කටයුතු සැලසුම් කිරිම නුතන මානවයා හමුවේ ඇති බරපතල මානව භේදවාචකයක් ලෙස හැදින්විය